# නව විදේශිකයන් පිළිගැනීම සහ සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වන සමාජයක් සාක්ෂාත් කර ගැනීම සඳහා මුල පිරීම

出入国在留管理庁
ජපාන ආගමන හා විගමන සේවා ඒජන්සිය

නවතම තොරතුරු සඳහා බලන්න (අධිකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය).


නව විදේශීය නිපුණ ශ්‍රමිකයන් පිළිගැනීම ("විශේෂිත නිපුණතා" නේවාසික තත්වයේ ආරම්භය)
http://www.moj.go.jp/nyuukokukanri/kouhou/nyuukokukanri01_00127.html

【ද්‍රව්‍ය (අන්තර්ගතය)】


1 විදේශීය පදිංචිකරුවන් සංඛ්‍යාවේ ප්‍රවණතා ········ 1
2 නේවාසික තත්ව ලැයිස්තුව ········ 2
3 නේවාසික තත්වය සහ ජාතිකත්වය අනුව විදේශීය පදිංචිකරුවන් සංඛ්‍යාවේ අනුබණ්ඩනය (2019 ජුනි මස අවසානය වන විට) ········ 3
4 විදේශීය ශ්‍රමික සංඛ්‍යාවේ අනුබණ්ඩනය ········ 4
5 විදේශීය ශ්‍රමිකයින් පිළිගැනීම ········ 5
6 ක්‍රමවේද දළ සටහන (1) නේවාසික තත්වය ········ 6
7 ක්ෂේත්‍ර අනුව ප්‍රතිපත්ති (ක්ෂේත්‍ර 14 කි) ········ 7
8 තාක්ෂණික සීමාවාසික පුහුණු හා විශේෂිත නිපුණතා ශ්‍රමික යන ක්‍රමවේද අතර සංසන්දනය (ලුහුඬින් ) ········ 10
9 ක්‍රමවේද දළ සටහන (2) සත්කාරක සංවිධාන හා ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන ········ 11
10 ක්‍රමවේද දළ සටහන (3) රාජකාරි ඇරඹීමට පෙර ප්‍රවාහය ········ 12
11 අනුග්‍රාහක සැලසුම් දළ සටහන (1) ········ 13
12 අනුග්‍රාහක සැලසුම් දළ සටහන (2) ········ 14
13 ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන මොනවා ද? ········ 15
14 දැනුම්දීම් (සත්කාරක සංවිධාන සහ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන) ········ 16
15 ක්ෂේත්‍ර අනුව විශේෂිත නිපුණතා ශ්‍රමික මණ්ඩල ········ 17
16 "විශේෂිත නිපුණතා ශ්‍රමිකයන්" සඳහා වන සහයෝගිතා ගිවිසුමේ (MOC) දළ සටහන ········ 18
17 විශේෂිත නිපුණතා ශ්‍රමික ක්‍රමයේ මෙහෙයුම් තත්ත්වය (1) ········ 19
18 මූලික ප්‍රතිපත්ති සහ නිසි අමාත්‍යාංශ ආඥා පනත ආදිය ········ 21
19 විදේශිකයන් පිළිගැනීම හා සමාජ සහජීවනය සඳහා පුළුල් පියවර ········ 30
20 යොමු ද්‍රව්‍ය ········ 34

# විදේශීය පදිංචිකරුවන් සංඛ්‍යාවේ ප්‍රවණතා

出入国在留管理庁
ජපාන ආගමන හා විගමන සේවා ඒජන්සිය




* සෑම වසරකම අවසානයේ තත්වය. 2011 වසර දක්වා ලියාපදිංචි විදේශිකයන් සංඛ්‍යාව පෙන්නුම් කරන අතර 2012 වසරේ සිට විදේශීය පදිංචිකරුවන් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

# නේවාසික තත්ව ලැයිස්තුව

## රැකියාවන් කල හැකි නේවාසික තත්ව (ක්‍රියාකාරකම් සීමා ඇත)

| නේවාසික තත්වය | උදාහරණ |
|---|---|
| රාජ්‍ය දූත | විදේශ රජයක තානාපති හෝ ඇමති සහ ඔවුන්ගේ පවුලේ අය |
| නිලධාරි | මහජන කටයුතුවල නියැලී සිටින විදේශීය රාජ්‍ය සේවකයන් සහ ඔවුන්ගේ පවුලේ අය |
| මහාචාර්ය | විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් ආදිය |
| කලාකරු | කර්තෘන්, චිත්‍ර ශිල්පීන් හෝ ලේඛකයන් යනාදිය |
| ආගමික | විදේශ ආගමික සංවිධානයකින් පිටත් කල මිෂනාරිවරුන් |
| මාධ්‍යවේදී | විදේශ මාධ්‍ය වාර්තාකරුවන් හෝ ඡායාරූප ශිල්පීන් යනාදිය |
| ඉහළ නිපුණතා සහිත වෘත්තික | ලකුණු ක්‍රමය යටතේ ඉහළ නිපුණතා ඇති වෘත්තිකයන් |
| ව්‍යාපාර කළමනාකාර | සමාගමක කළමනාකරු හෝ පරිපාලක යනාදිය |
| නීති / ගිණුම් සේවා | නීතිඥ හෝ සහතික කළ රාජ්‍ය ගණකාධිකාරී |
| වෛද්‍ය සේවා | වෛද්‍යවරු, දන්ත වෛද්‍යවරු හෝ ලියාපදිංචි හෙදියන් යනාදිය |
| පර්යේෂක | රජයේ ආයතනයක හෝ සමාගමක පර්යේෂකයන් යනාදිය |
| උපදේශක | උසස් පෙළ විද්‍යාලයක හෝ කනිෂ්ඨ විද්‍යාලයක භාෂා උපදේශක යනාදිය |
| මානව ශාස්ත්‍ර / ජාත්‍යන්තර සේවා හි ඉංජිනේරු / විශේෂඥ | යාන්ත්‍රික ඉංජිනේරු, භාෂා පරිවර්තක, නිර්මාණකරුවන්, භාෂා උපදේශක යනාදිය |
| අන්තර් සමාගම් පැවරුම්ලාභී | විදේශීය කාර්යාලයක පැවරුම්කරුවන් |
| හෙද සත්කාර | සත්කාර සේවක |
| රංගන ශිල්පි | නළුවන්, ගායක හෝ වෘත්තීය මලල ක්‍රීඩක යනාදිය |
| නිපුණතා ශ්‍රමික | විදේශීය කෝකියන්, ක්‍රීඩා උපදේශක |
| විශේෂිත නිපුණතා ශ්‍රමික (සටහන 1) | විශේෂිත කාර්මික ක්ෂේත්‍රයකට අයත් ප්‍රවීණ කුසලතා අවශ්‍ය වන වැඩවල නිරත වන විදේශිකයන් (සටහන 2) |
| තාක්ෂණික සීමාවාසික පුහුණු | තාක්ෂණික සීමාවාසික (නේවාසික) පුහුණු |

සටහන 1: 2019 අප්රේල් 1 සිට

සටහන 2: හෙද සත්කාර, ගොඩනැගිලි පිරිසිදු කිරීම, යන්ත්‍ර කොටස් සහ මෙවලම් කර්මාන්ත, කාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්තය, විදුලි, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු කර්මාන්ත, ඉදිකිරීම් කර්මාන්තය, නැව් තැනීම සහ නැව් යන්ත්‍රෝපකරණ කර්මාන්තය, මෝටර් රථ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම, ගුවන් සේවා කර්මාන්තය, හෝටල් කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ධීවර හා ජලජීවී වගාව, ආහාර සහ බීම නිෂ්පාදනය, ආහාර සේවා කර්මාන්තය (2018 දෙසැම්බර් 25 දින කැබිනට් තීරණය).

## පුද්ගලික තත්වය හෝ තනතුර මත පදනම් වූ නේවාසික තත්ව (සීමාවන් නොමැතිව)

| නේවාසික තත්වය | උදාහරණ |
|---|---|
| ස්ථිර පදිංචි | ස්ථිර පදිංචියට අවසරලත් පුද්ගලයෙක් |
| ජපන් ජාතිකයකුගේ කලත්‍රයා හෝ දරුවා | කලත්‍රයා, දාව උපන් දරුවා හෝ ජපන් ජාතිකයෙකුගෙන් දරුකමට හදාගත් දරුවා |
| ස්ථිර පදිංචිකරුවකුගේ කලත්‍රයා හෝ දරුවා | ස්ථිර පදිංචිකරුවෙකුගේ / විශේෂ ස්ථිර පදිංචිකරුවෙකුගේ කලත්‍රයා, හෝ ජපානයේ උපත ලැබූ සහ දිගටම ජපානයේ පදිංචිව සිටින දාව උපන දරුවකු |
| දිගු කාලීන පදිංචිකරුවෙකු | විදේශීය කලත්‍රයෙකුගේ දරුවන් සිටින තෙවන පරම්පරාවේ ජපන් ජාතිකයකු යනාදිය. |

## විශේෂයෙන් නම් කරන ලද ක්‍රියාකාරකම් සඳහා වූ නේවාසික තත්ව

| නේවාසික තත්වය | උදාහරණ |
|---|---|
| නම් කරන ලද ක්‍රියාකාරකම් | රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය ආදිය, වරකින් හොලිඩේ |


## වැඩ කිරීමට අවසර නැති නේවාසික තත්ව (*)

| නේවාසික තත්වය | උදාහරණ |
|---|---|
| සංස්කෘතික ක්‍රියාකාරකම් | ජපන් සංස්කෘතිය පිළිබඳ පර්යේෂකයන් යනාදිය. |
| තාවකාලික සංචාරක | සංචාරක හෝ සම්මන්ත්‍රණයන්ට සහභාගිවන්නන් යනාදිය. |
| ශිෂ්‍ය | විශ්ව විද්‍යාල, විද්‍යාල හෝ භාෂා පාසල් වල ශිෂ්‍යයන් හෝ සිසුන් |
| අභ්‍යාසලාභීන් | අභ්‍යාසලාභීන් |
| යැපෙන්නන් | විදේශීය නේවාසිකයාගෙන් යැපෙන කලත්‍රයා හෝ දරුවා. |


* සුදුසුකම් නොමැති ක්‍රියාකාරකම් කිරීම සඳහා අවසර ලබා ගත හොත්, යම් ප්‍රමාණයකට රැකියාවක් කිරීමට අවසර ලැබේ.

## මුළු විදේශිකයන්ගේ සංඛ්‍යාව: 2,829,416


### නේවාසික තත්වය




### ජාතිකත්වය / කලාපය



# විදේශීය ශ්‍රමික සංඛ්‍යාවේ අනුඛණ්ඩනය




**(1) තත්වය මත පදනම් වූ පදිංචිකරුවන් - පුද්ගලයන් 532,000 පමණ**

(මූලික වශයෙන් "දීර්ඝ කාලීන පදිංචිකරුවන්" (ප්‍රධාන වශයෙන් ජපන් ජාතිකයන්ගෙන් පැවත එන විදේශිකයින්), "ස්ථිර පදිංචිකරුවන්" සහ "ජපන් ජාතිකයන්ගේ කාලත්‍රයා හෝ දරුවා" ආදිය)

・මෙම නේවාසික තත්වයන් සඳහා නිරත විය හැකි ක්‍රියාකාරකම්හි කිසිදු සීමාවක් නොමැත, එබැවින් වේතනය සඳහා විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් කළ හැකිය.

**(2) රැකියා අරමුණු කරගත් පදිංචිකරුවන් - පුද්ගලයන් 329,000 පමණ**

("වෘත්තීමය හා තාක්ෂණික ක්ෂේත්‍ර" ලෙස කියන)

・මෙහි සමහර නේවාසික තත්වයන් සඳහා, "ජපන් කර්මාන්ත සහ පුරවැසියන්ගේ ජීවිතවලට සහ වෙනත් තත්වයන්ට ඇති බලපෑම" සැලකිල්ලට ගනිමින් ජපානයට ගොඩ බැසීමේ නිර්ණායක තීරණය වේ.

**(3) නම් කරන ලද ක්‍රියාකාරකම් - පුද්ගලයන් 41,000 පමණ**

(EPA මත පදනම් වූ විදේශීය හෙද / සත්කාර සේවක අපේක්ෂකයින්, වර්කින් හොලිඩේ, විදේශීය ඉදිකිරීම් කම්කරුවන්, විදේශීය නැව් තැනීමේ කම්කරුවන් ආදිය)

・"නම් කරන ලද ක්‍රියාකාරකම්" නේවාසික තත්වය යටතේ ජපානයේ වෙසෙන විදේශිකයින්ට, ඔවුන්ට ලැබී ඇති අවසරය මත පදනම්ව වේතනය ලැබීමට අවසර තිබිය හෝ නොතිබිය හැකි ය.

**(4) තාක්ෂණික සීමාවාසික පුහුණුව - පුද්ගලයන් 384,000 පමණ**

නිපුණතා හුවමාරුව තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ ජාත්‍යන්තර සහයෝගිතාව ඇති කර ගැනීම මෙහි ඉලක්කයයි.
2010 ජුලි 1 වන දින, ආගමන විගමන පාලන හා සරණාගතයින් හඳුනා ගැනීමේ සංශෝධිත පනත යටතේ, කාර්මික අභ්‍යාසලාභීන්ට ජපානයට ඇතුළු වූ පළමු වසරේ සිටම රැකියා සබඳතා සඳහා "තාක්ෂණික සීමාවාසික පුහුණු" නේවාසික තත්වය ලබා දෙයි.

**(5) නේවාසික තත්වය යටතේ අවසර දී ඇති ඒවා හැර අනෙකුත් ක්‍රියාකාරකම් (විදේශීය ශිෂ්‍ය අර්ධකාලීන රැකියා ආදිය) - පුද්ගලයන් 373,000 පමණ**

・නේවාසික තත්වයේ මූලික ක්‍රියාකාරකම් වලට බාධා නොවන පරාසයක් තුළ වේතනය සඳහා වන ක්‍රියාකාරකම් කිරීම සුදුසු යැයි සලකනු ලැබේ (සතියකට පැය 28 ක් දක්වා).

LW විසින් නිකුත් කරන ලද "විදේශ රැකියා තත්වයන්ගේ" සාරාංශය මත පදනම්ව (සෑම වසරකම ඔක්තෝබර් අවසානය වන විට)

# විදේශීය ශ්‍රමිකයින් පිළිගැනීම



## දැනට පවතින මූලික සංකල්ප

**විශේෂිත හා තාක්ෂණික ක්ෂේත්‍රවල සිටින විදේශීය ශ්‍රමිකයින්** → **සක්‍රියව පිළිගැනීම**

- ජපානයේ ආර්ථික හා සමාජීය පුනර්ජීවන දෘෂ්ඨි කෝණයෙන් හා ජාත්‍යන්තරීකරණය වැඩිදියුණු කිරීම පිණිස, විශේෂිත හා කාර්මික ක්ෂේත්‍රවල සිටින විදේශීය ශ්‍රමිකයින්ගේ සක්‍රිය පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම (9 වන මූලික සේවා නියුක්ත සැලසුම (අමාත්‍ය මණ්ඩල තීරණය))
- විශේෂිත හා තාක්ෂණික ක්ෂේත්‍රවල සිටින විදේශීය ශ්‍රමිකයින්ගේ නේවාසික තත්වය සඳහා අයැදුම් කිරීමේ හා තීරණය කිරීමේ ක්‍රියා පිළිවෙත් පැහැදිලි කර, ඒවායේ බර අඩු කිරීම තුළින්, ජපන් ආර්ථිකය හා සමාජය සක්‍රිය කිරීමට දායක වනු ලබන විදේශිකයින් සුමටව පිළිගැනීම මෙයින් අරමුණු කෙරේ. (ආගමන පාලනය සඳහා මූලික සැලැස්ම (අධිකරණ අමාත්‍යාංශය))

**වෙනත් ක්ෂේත්‍රවල සිටින විදේශීය ශ්‍රමිකයින්** → **විවිධ සලකා බැලීම් අවශ්‍ය වේ**

- ජපන් ආර්ථිකය හා සමාජය සහ පුරවැසියන්ගේ ජීවිත මත සැලකිය යුතු බලපෑමක් ඇති වන නිසා, පුරවැසියන්ගේ එකඟත්වය මත පදනම්ව, නිසි ආරක්ෂක පියවර ගැනේ (9 වන මූලික සේවා නියුක්ත සැලසුම (අමාත්‍ය මණ්ඩල තීරණය))
- කෙසේ වෙතත්, විදේශ රාජ්‍යවල ක්‍රමවේද හා තත්වයන් අවබෝධ කර ගැනීමෙන් හා පුරවැසියන්ගේ අදහස්වලට සක්‍රියව සවන් දීමෙන්, මිනිස් බල හිඟය විසඳීමේ කාර්යය සඳහා වූ "විශේෂිත නිපුණතා ශ්‍රමික" නේවාසික තත්වය ප්‍රයෝජනයට ගැනීම ද සැලකිල්ලට ගනිමින්, අනාගතයේ දී විදේශිකයින් පිළිගැනීම ගැන රාජ්‍ය ආයතන වල පුළුල් ලෙස කල්පනාවට ගැනීමේ අවශ්‍යතාවක් තිබේ. (ආගමන පාලනය සඳහා මූලික සැලැස්ම (අධිකරණ අමාත්‍යාංශය))

# ක්‍රමවේද දළ සටහන (1) නේවාසික තත්වය



- **විශේෂිත නිපුණතා ශ්‍රමික** (i): සැලකිය යුතු මට්ටමක ප්‍රවීණතාවයක් හෝ පළපුරුද්දක් අවශ්‍ය වන විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍රවල සේවය කරන විදේශිකයන් ඉලක්ක කරගත් නේවාසික තත්වය කි.
- **විශේෂිත නිපුණතා ශ්‍රමික** (ii): නිපුණතා ඇති සේවකයින් අවශ්‍ය වන විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍රවල සේවය කරන විදේශිකයන් සඳහා වන නේවාසික තත්වයකි.

විශේෂිත කර්මාන්ත ක්ෂේත්‍ර (ක්ෂේත්‍ර 14): හෙද සත්කාර, ගොඩනැගිලි පිරිසිදු කිරීම, යන්ත්‍ර කොටස් සහ මෙවලම් කර්මාන්ත, කාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්තය, විදුලි, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු කර්මාන්ත, ඉදිකිරීම් කර්මාන්තය, නැව් තැනීම සහ නැව් යන්ත්‍රෝපකරණ කර්මාන්තය, මෝටර් රථ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම, ගුවන් සේවා කර්මාන්තය, හෝටල් කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ධීවර හා ජලජීවී වගාව, ආහාර සහ බීම නිෂ්පාදනය, ආහාර සේවා කර්මාන්තය

(විශේෂිත නිපුණතා ශ්‍රමික (ii) ට අදාළ වන්නේ යටින් ඉරි ඇඳ ඇති ක්ෂේත්‍ර දෙක පමණි)


## විශේෂිත නිපුණතා ශ්‍රමික (i) සඳහා වූ ප්‍රධාන කරුණු

- වීසා වලංගු කාලය: සෑම මාස 4, 6 හෝ 12 කට වරක් දීර්ඝ කෙරේ, උපරිම වශයෙන් එකතුව අවුරුදු 5 ක් දක්වා අලුත් කරනු ලැබේ.
- නිපුණතා ප්‍රමිති: විභාග මගින් පරීක්ෂා කෙරේ (තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii) සාර්ථකව සම්පූර්ණ කළ අය පරීක්ෂණයෙන් නිදහස් වේ)
- ජපන් භාෂා හැකියාව: ජපන් භාෂා හැකියාව එදිනෙදා ජීවිතයේ දී සහ වැඩපොළේ දී අවශ්‍ය වේ. විභාග මගින් පරීක්ෂා කෙරේ (තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii) සාර්ථකව සම්පූර්ණ කළ විදේශිකයින් පරීක්ෂණයෙන් නිදහස් වේ)
- පවුලේ සාමාජිකයින් සමග පදිංචිය: මූලික වශයෙන් අවසර නැත.
- සත්කාරක සංවිධාන හෝ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන මගින් අනුග්‍රහ ලබා ගත හැක.

## විශේෂිත නිපුණතා ශ්‍රමික (ii) සඳහා වූ ප්‍රධාන කරුණු

- වීසා වලංගු කාලය : සෑම මාස 6 කට වරක්, අවුරුදු 1 කට හෝ අවුරුදු 3 කට වරක් අලුත් කරනු ලැබේ.
- නිපුණතා ප්‍රමිති : විභාග මගින් පරීක්ෂා කෙරේ.
- ජපන් භාෂා හැකියාව: විභාග ආදිය මගින් පරීක්ෂා කිරීම අවශ්‍ය නොවේ.
- පවුලේ සාමාජිකයින් සමග පදිංචිය: අවශ්‍යතා සපුරාලන්නේ නම් හැකි වේ (කලත්‍රයා, දරුවා)
- සත්කාරක සංවිධාන හෝ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන මගින් අනුග්‍රහ ලබා ගත නොහැක.

[රැකියා කිරීමට අවසර ඇති නේවාසික තත්ව සඳහා නිපුණතා මට්ටම්]



# ක්ෂේත්‍ර අනුව ප්‍රතිපත්ති (ක්ෂේත්‍ර 14 කි)

| | ක්ෂේත්‍ර | ශ්‍රම ඌනතාවය | මානව සම්පත් ප්‍රමිති | | වෙනත් වැදගත් කරුණු | | |
|---|---|---|---|---|---|---|---|
| | | පිළිගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව (අවුරුදු 5ක් තුල එකතුව උපරිම ) (*) | නිපුණතා විභාගය | ජපන් භාෂා විභාග | රැකියා අවස්ථා | සේවා නියුක්තිය | සත්කාරක සංවිධාන පිළිබඳ විශේෂ කොන්දේසි |
| සෞඛ්‍ය, කම්කරු හා සුභසාධන අමාත්‍යාංශය | හෙද සත්කාර | පුද්ගලයන් 60,000 | හෙද සත්කාරක කුසලතා ඇගයීම් පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි<br>(ඉහත සඳහන් හෙද සත්කාර ජපන් භාෂා ඇගයීම් පරීක්ෂණයට අමතරව) | - හෙද සත්කාර සේවයට අමතරව (පරිශීලකයාගේ ශාරීරික හා මානසික තත්වයට අනුව ස්නානය, ආහාර ගැනීම සහ බහිස්සරාවය සඳහා සහාය වීම), හා වෙනත් ආශ්‍රිත සත්කාර සේවා (විනෝදාස්වාද සහ ක්‍රියාකාරී පුහුණුව යනාදිය සඳහා සහය වීම)<br>සටහන: බාහිර සේවා ඇතුළත් නොවේ<br>(පරීක්ෂණ කාණ්ඩ 1 කි) | සෘජු | ･MHLW විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･MHLW සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･සෑම කාර්යාලයකින්ම බාර ගන්නා පුද්ගලයින් සංඛ්‍යාව ස්ථාවරව තැබීම |
| | ගොඩනැගිලි පිරිසිදු කිරීම | පුද්ගලයන් 37,000 | ගොඩනැගිලි පිරිසිදු කිරීමේ ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | − ගොඩනැගිලි ඇතුළත පිරිසිදු කිරීම<br>(පරීක්ෂණ කාණ්ඩ 1 කි) | සෘජු | ･MHLW විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･MHLW සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･“ගොඩනැගිලි පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක්” හෝ “පුළුල් ගොඩනැගිලි සනීපාරක්ෂක කළමනාකරණ ව්‍යාපාරයක්” ලෙස ලියාපදිංචි කර තිබීම. |
| ආර්ථික, වෙළඳ හා කර්මාන්ත අමාත්‍යාංශය | යන්ත්‍ර කොටස් සහ මෙවලම් කර්මාන්ත | පුද්ගලයන් 21,500 | නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･වාත්තු කිරීම ･කර්මාන්තශාලා තහඩු ලෝහ වැඩ<br>･ යන්ත්‍ර පරීක්ෂා කිරීම<br>･හැඩ තැළීම ･ආලේපනය ･යන්ත්‍ර නඩත්තු කිරීම<br>･කැට වාත්තු කිරීම ･ඇලුමිනියම් ඇනෝඩයිසින් ･පින්තාරු කිරීම<br>･යන්ත්‍රකරණය ･පෑස්සීම ･ලෝහ තෙරපීම ･නිමාකරණය<br>(පරීක්ෂණ කාණ්ඩ 13 කි) | සෘජු | ･METI විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･METI සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම |
| | කාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්තය | පුද්ගලයන් 5,250 | නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･වාත්තු කිරීම ･කර්මාන්තශාලා තහඩු ලෝහ වැඩ<br>･ ඉලෙක්ට්‍රොනික උපකරණ එකලස් කිරීම<br>･හැඩ තැළීම ･ආලේපනය ･විදුලි උපකරණ එකලස් කිරීම<br>･කැට වාත්තු කිරීම ･නිමාකරණය ･ මුද්‍රිත වයර් පුවරු නිෂ්පාදනය<br>･යන්ත්‍රකරණය ･යන්ත්‍ර පරීක්ෂා කිරීම<br>･ ප්ලාස්ටික් අච්චු ගැසීම<br>･පින්තාරු කිරීම ･යන්ත්‍ර නඩත්තු කිරීම<br>･ලෝහ තෙරපීම<br>･යකඩ වැඩ ･කාර්මික ඇසුරුම්කරණය ･පෑස්සීම<br>(පරීක්ෂණ කාණ්ඩ 18 කි) | සෘජු | ･METI විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･METI සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම |
| | විදුලි, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු කර්මාන්ත | පුද්ගලයන් 4,700 | නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･යන්ත්‍රකරණය ･යන්ත්‍ර නඩත්තු කිරීම<br>･ පින්තාරු කිරීම<br>･ලෝහ තෙරපීම ･විදුලි උපකරණ එකලස් කිරීම<br>･පෑස්සීම<br>･කර්මාන්තශාලා තහඩු ලෝහ වැඩ ･විදුලි උපකරණ එකලස් කිරීම<br>･කාර්මික ඇසුරුම්කරණය<br>･ආලේපනය ･ මුද්‍රිත වයර් පුවරු නිෂ්පාදනය<br>･නිමාකරණය ･ ප්ලාස්ටික් අච්චු ගැසීම<br>(පරීක්ෂණ කාණ්ඩ 13 කි) | සෘජු | ･METI විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･METI සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම |

# ක්ෂේත්‍ර අනුව ප්‍රතිපත්ති (ක්ෂේත්‍ර 14 කි)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය | ඉදිකිරීම් කර්මාන්තය | පුද්ගලයන් 40,000 | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･ආකෘති නිර්මාණය<br>･පොළොවේ වැඩ<br>･අභ්‍යන්තර නිමාකරණය / ද්‍රව්‍ය සවි කිරීම<br>･කපරාරු කිරීම<br>･වහල තැනීම<br>･කොන්ක්‍රීට් පොම්ප කිරීම<br>･විදුලි සංදේශනය<br>･උමං මාර්ග සහ ප්‍රචාලනය<br>･වැර ගැන්නූ කොන්ක්‍රීට් ඉදිකිරීම්<br>･ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ ඉදිකිරීම්<br>･වැර ගැන්නූ කොන්ක්‍රීට් සන්ධි<br>･පලංචි<br>･වඩු කාර්මික<br>･ජල නල කාර්මික<br>･ගොඩනැගිලි තහඩු ලෝහ වැඩ<br>･උණුසුම් හා සිසිල් කළමනාකරණය<br>･යුරේතන් තාප පරිවරණ ඉසීම<br>･අක්වෙරළ සිවිල් ඉංජිනේරු<br>(පරීක්ෂණ කාණ්ඩ 18 කි) | සෘජු | ･විදේශිකයන් පිළිගැනීම සඳහා වන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයට අයත් වීම<br>･METI සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･ඉදිකිරීම් කර්මාන්ත පනත යටතේ සහතික කරන ලද ව්‍යාපාරයක් වීම<br>･ජපන් ජනතාවට සමාන හෝ ඊට වඩා වැඩි ස්ථාවර ගෙවීම් කරන කොන්ත්‍රාත්තුවක් ඇතිව, නිපුණතා හා ප්‍රවීණතා අනුව වැටුප් වැඩි කිරීමට යටත් වීම.<br>･සේවා කොන්ත්‍රාත්තුවට අදාළ වැදගත් කරුණු සම්මුඛ සාකච්ඡා වලදී පුද්ගලයාගේ මව් බසින් ලිඛිතව ලබා දීමෙන් පැහැදිලි කිරීම.<br>･පිළි ගන්නා පුද්ගලයින් සංඛ්‍යාව සත්කාරක ඉදිකිරීම් සමාගම මත තීරණය වෙයි.<br>･MLIT විසින් සහතික කරන ලද "ඉදිකිරීම් කර්මාන්ත විශේෂිත නිපුණතා ශ්‍රමික සත්කාරක සැලැස්මක්" තුළ වේතන ආදිය විස්තර කෙරේ.<br>･MLIT විසින් සහතික කරන ලද "ඉදිකිරීම් විශේෂිත නිපුණතා ශ්‍රමික සත්කාරක සැලැස්ම" නිසි පරිදි ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.<br>･විශේෂිත නිපුණතා සහිත විදේශිකයන් සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීමය දියුණුව සලසන ක්‍රමවේදයකට ලියාපදිංචි වී තිබීම. |
| ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය | නැව් තැනීම සහ නැව් යන්ත්‍රෝපකරණ කර්මාන්තය | පුද්ගලයන් 13,000 | නැව් තැනීම හා නාවික ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･පෑස්සීම ･නිමාකරණය<br>･පින්තාරු කිරීම ･යන්ත්‍රකරණය<br>･යකඩ වැඩ ･විදුලි උපකරණ එකලස් කිරීම<br>(පරීක්ෂණ කාණ්ඩ 6 කි) | සෘජු | ･MLIT විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･MLIT සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･සත්කාරක සැලසුම් ක්‍රියාත්මක කිරීම බාහිර ලියාපදිංචි සත්කාරක සංවිධානයකට ලබා දීමේ දී, ඉහත කොන්දේසි සපුරා ලන ලියාපදිංචි සත්කාරක සංවිධානයකට එය ලබා දෙන බවට සහතික විය යුතු ය. |
| ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය | මෝටර් රථ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | පුද්ගලයන් 7,000 | මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව පිලිබඳ විශේෂිත නිපුණතා ශ්‍රමික ඇගයීම් පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･මෝටර් රථ එදිනෙදා පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම, නිතිපතා පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම, කොටස් කිරීම<br>(පරීක්ෂණ කාණ්ඩ 1 කි) | සෘජු | ･MLIT විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･MLIT සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･සත්කාරක සැලසුම් ක්‍රියාත්මක කිරීම බාහිර ලියාපදිංචි සත්කාරක සංවිධානයකට ලබා දීමේ දී, ඉහත කොන්දේසි සපුරාලන ලියාපදිංචි සත්කාරක සංවිධානයකට එය ලබා දෙන බවට සහතික විය යුතු ය.<br>･මාර්ග හා වාහන පනත යටතේ සහතික කළ ව්‍යාපාර |
| ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය | ගුවන් සේවා කර්මාන්තය | පුද්ගලයන් 2,200 | විශේෂිත නිපුණතා ශ්‍රමික ඇගයීම් පරීක්ෂණය (ගුවන් ක්ෂේත්‍රය: ගුවන් තොටුපල පොළොවේ ක්‍රියාකාරකම්, ගුවන් යානා නඩත්තු කිරීම) | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･ගුවන් තොටුපල පොළොවේ ක්‍රියාකාරකම් (බිම් ධාවන අනුග්‍රාහක සේවා, ගමන් මලු සහ භාණ්ඩ ප්‍රවාහන සේවා)<br>･ගුවන් යානා නඩත්තු කිරීම (ගුවන් යානා සහ උපකරණ නඩත්තු කිරීම ආදිය)<br>(පරීක්ෂණ කාණ්ඩ 2 කි) | සෘජු | ･MLIT විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･MLIT සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･සත්කාරක සැලසුම් ක්‍රියාත්මක කිරීම බාහිර ලියාපදිංචි සත්කාරක සංවිධානයකට ලබා දීමේ දී, ඉහත කොන්දේසි සපුරාලන ලියාපදිංචි සත්කාරක සංවිධානයකට එය ලබා දෙන බවට සහතික විය යුතු ය.<br>･ගුවන් තොටුපල කළමනාකරණ රෙගුලාසි මත පදනම් වූ ස්ථානීය ව්‍යාපාර සහතිකයක් හෝ ගුවන් සේවා පනත යටතේ ගුවන් යානා නඩත්තු කිරීම සඳහා සහතික කරන ලද ව්‍යාපාර |
| ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය | හෝටල් කර්මාන්තය | පුද්ගලයන් 22,000 | හෝටල් නිපුණතා ඇගයීමේ පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | ･පිළිගැනීමේ සේවා, සැලසුම් කිරීම / මහජන සම්බන්ධතා, ආගන්තුක සත්කාර, ආපනශාලා සේවා වැනි හෝටල් සේවා සැපයීම<br>(පරීක්ෂණ කාණ්ඩ 1 කි) | සෘජු | ･MLIT විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･MLIT සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>･සත්කාරක සැලසුම් ක්‍රියාත්මක කිරීම බාහිර ලියාපදිංචි සත්කාරක සංවිධානයකට ලබා දීමේ දී, ඉහත කොන්දේසි සපුරාලන ලියාපදිංචි සත්කාරක සංවිධානයකට එය ලබා දෙන බවට සහතික විය යුතු ය.<br>･බලයලත් "තානායම / හෝටල් අලෙවිකරු"<br>･වැඩිහිටි විනෝදාස්වාද ව්‍යාපාරවලට අදාළ අලෙවි කටයුතු නොකිරීම<br>･වැඩිහිටි විනෝදාස්වාද ව්‍යාපාරවලට සෘජුවම සම්බන්ධ නොවීම. |

# ක්ෂේත්‍ර අනුව ප්‍රතිපත්ති (ක්ෂේත්‍ර 14 කි)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්ම, වන විද්‍යා හා ධීවර අමාත්‍යාංශය** | කෘෂිකර්මාන්තය | **පුද්ගලයන්** 36,500 | කෘෂිකාර්මික කුසලතා ඇගයීමේ පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | •සාමාන්‍ය බෝග ගොවිතැන (වගා කළමනාකරණය, කෘෂිකාර්මික නිෂ්පාදන එකතු කිරීම / නැව් ගත කිරීම / වර්ග කිරීම ආදිය)<br><br>•සාමාන්‍ය පශු සම්පත් ගොවිතැන (අභිජනන කළමනාකරණය, පශු සම්පත් නිෂ්පාදන එකතු කිරීම / නැව් ගත කිරීම / වර්ග කිරීම ආදිය)<br>(පරීක්ෂණ කාණ්ඩ 2 කි) | සෘජු<br><u>පිටත් කිරීම</u> | •MAFF විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>•MAFF සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>•සත්කාරක සැලසුම් ක්‍රියාත්මක කිරීම බාහිර ලියාපදිංචි සත්කාරක සංවිධානයකට ලබා දීමේ දී, කවුන්සිලයට අවශ්‍ය සහයෝගීතාව සපයන ලියාපදිංචි සත්කාරක සංවිධානයකට එය ලබා දිය යුතු ය.<br>•නිශ්චිත කාලයකට වඩා වැඩි කාලයක් සේවකයින් පිළිගැනීමේ අත්දැකීම් ඇති කෘෂිකාර්මික කළමනාකරණ ආයතන |
| | ධීවර හා ජලජීවී වගාව | පුද්ගලයන් 9,000 | ධීවර කර්මාන්ත කුසලතා ඇගයීමේ පරීක්ෂණය (ධීවර හෝ ජලජීවී වගාව) | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | •ධීවර කටයුතු (ධීවර ආම්පන්න නිෂ්පාදනය හා අලුත්වැඩියා කිරීම, සමුද්‍ර සතුන් හා පැළෑටි සෙවීම, ධීවර ආම්පන්න සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීම, සමුද්‍ර සතුන් හා පැළෑටි ඇල්ලීම සැකසීම හා ගබඩා කිරීම, සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම යනාදිය)<br>•ජලජීවී වගා කර්මාන්තය (ජලජීවී වගා ද්‍රව්‍ය නිෂ්පාදනය, අලුත්වැඩියා කිරීම සහ කළමනාකරණය, අභිජනන කළමනාකරණය, එකතු කිරීම (පලදාව නෙළීම) සහ ජලජීවී සතුන් සහ ශාක සැකසීම, සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම යනාදිය)<br>(පරීක්ෂණ කාණ්ඩ 2 කි) | සෘජු<br><u>පිටත් කිරීම</u> | •MAFF විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>•MAFF සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>•MAFF විසින් සංවිධානය කරන ලද සභාවල සාකච්ඡා කර ඇති ක්‍රියාමාර්ග ගැනීම<br>•සත්කාරක සැලසුම් ක්‍රියාත්මක කිරීම බාහිර ලියාපදිංචි සත්කාරක සංවිධානයකට ලබා දීමේ දී, ලියාපදිංචි සත්කාරක සංවිධානය එම ක්ෂේත්‍රයේ විශේෂිත ප්‍රමිතීන්ට එකඟ වන බවට සහතික වීම. |
| | ආහාර සහ පාන නිෂ්පාදනය | පුද්ගලයන් 34,000 | ආහාර පාන නිෂ්පාදන කර්මාන්ත විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | •සාමාන්‍ය ආහාර පාන නිෂ්පාදනය (ආහාර පානවල නිෂ්පාදනය / සැකසුම හා සෞඛ්‍ය සහ ආරක්ෂාව (මත්පැන් හැර)<br>(පරීක්ෂණ කාණ්ඩ 1 කි) | සෘජු | •MAFF විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>•MAFF සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම |
| | ආහාර සේවා කර්මාන්තය | පුද්ගලයන් 53,000 | ආහාර සේවා කර්මාන්ත විශේෂිත නිපුණතා ශ්‍රමික (i) පරීක්ෂණය | මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය හෝ ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය N4 හෝ ඊට වැඩි | •සාමාන්‍ය අවන්හල් කර්මාන්තය (ආහාර පාන සැකසීම, පාරිභෝගික සේවය, ගබඩා කළමනාකරණය)<br>(පරීක්ෂණ කාණ්ඩ 1 කි) | සෘජු | •MAFF විසින් සංවිධානය කරන ලද කවුන්සිලයකට සහභාගී වී අවශ්‍ය සහයෝගය ලබා දීම<br>•MAFF සමීක්ෂණවලට හෝ මග පෙන්වීමට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම<br>•වැඩිහිටි විනෝදාස්වාද ව්‍යාපාරවලට අදාළ අලෙවි කටයුතු නොකිරීම<br>•වැඩිහිටි විනෝදාස්වාද ව්‍යාපාරවලට සෘජුවම සම්බන්ධ නොවීම. |

සටහන: ක්ෂේත්‍ර 14 තුළ පිළිගැනීමට අපේක්ෂා කරන මුළු සංඛ්‍යාව (අවුරුදු 5ක් තුල උපරිම): 345,150 කි

| | තාක්ෂණික සීමාවාසික පුහුණුව (කණ්ඩායම් අධීක්ෂණය) | විශේෂිත නිපුණතා ශ්‍රමික (i) |
|---|---|---|
| අදාළ නීති සහ රෙගුලාසි | විදේශීය ශ්‍රමිකයන්ගේ තාක්ෂණික සීමාවාසික පුහුණුව නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සීමාවාසික ශ්‍රමිකයන් ආරක්ෂා කිරීම පිළිබඳ පනත/ ආගමන විගමන පාලනය සහ සරණාගතයින් හඳුනා ගැනීමේ පනත | ආගමන විගමන පාලනය හා සරණාගතයින් හඳුනා ගැනීමේ පනත |
| නේවාසික තත්වය | නේවාසික තත්වය: "තාක්ෂණික සීමාවාසික පුහුණුව" | නේවාසික තත්වය: "විශේෂිත නිපුණතා ශ්‍රමික" |
| වීසා වලංගු කාලය | තාක්ෂණික සීමාවාසික පුහුණුව (i): වසර 1ක් දක්වා; තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii): අවුරුදු 2 ක් දක්වා;<br>තාක්ෂණික සීමාවාසික පුහුණුව (iii): වසර 2 ක් දක්වා (එකතුව අවුරුදු 5 ක් දක්වා) | අවුරුදු 5 ක් දක්වා |
| විදේශීය ශ්‍රමික නිපුණතා මට්ටම | නැත | සැලකිය යුතු ප්‍රවීණත්වයක් හෝ පළපුරුද්දක් අවශ්‍ය වේ |
| ප්‍රවේශයේ දී පරීක්ෂා කිරීම | නැත<br>(ඇතුල්වීමේ දී පමණක්, හෙද වෘත්තීන් සඳහා N4 මට්ටමේ ජපන් භාෂා ප්‍රවීණත්වයක් අවශ්‍ය වේ) | විභාග යනාදිය මගින් පරීක්ෂා කිරීමෙන් නිපුණතා මට්ටම සහ ජපන් භාෂා ප්‍රවීණතාවය තහවුරු කෙරේ.<br>(තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii) සාර්ථකව සම්පූර්ණ කළ අය මෙයින් නිදහස් කෙරේ) |
| යොමු කිරීමේ නියෝජිතයා | විදේශ රජයේ නිර්දේශ හෝ සහතික කළ සංවිධානයක් | නැත |
| අධීක්ෂණ සංවිධානය | ඔව්<br>(ලාභ නොලබන ව්‍යාපාරික සමුපකාර විසින් අභ්‍යාසලාභීන් විගණනය කර, අනෙකුත් අධීක්ෂණ සිදු කරයි. නියමිත අමාත්‍යවරයා විසින් අවසර ලබා දෙයි) | නැත |
| අනුග්‍රාහක සංවිධානය | නැත | ඔව්<br>(සත්කාරක සංවිධානයෙන් ඉල්ලීම මත, විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයින්ට නිවාස හා අනුග්‍රහය ලබා දීම වෙනත් පුද්ගලයන්ට හෝ සංවිධානවලට සිදු කල හැකි ය. ලියාපදිංචි කිරීම ආගමන සේවා ඒජන්සිය විසින් සිදු කෙරේ) |
| සත්කාරක සංවිධාන සමඟ විදේශිකයන් ගැලපීම | සාමාන්‍යයෙන් අධීක්ෂණ සංවිධානය සහ යොමු කිරීමේ නියෝජිතයා හරහා සිදු කෙරේ | සත්කාරක සංවිධාන විසින් විදේශයන්හි සෘජු පිළිගැනීමේ ක්‍රියාකාරකම් සිදු කරයි, නැතහොත් ජපානයේ සහ විදේශයන්හි සිටින නියෝජිතයින් හරහා ක්‍රියා කරයි |
| සත්කාරක සංවිධානයේ පුද්ගලයින් සංඛ්‍යාව | පූර්ණ කාලීන සේවක සංඛ්‍යාව මත තීරණය වේ. | කෝටාවක් නැත (හෙද සත්කාර හා ඉදිකිරීම් කර්මාන්තය හැර) |
| ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර | තාක්ෂණික සීමාවාසික පුහුණු සැලැස්ම (i) මත පදනම්ව පුහුණුව ලැබීම සහ කුසලතා සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත වීම සිදු වේ.<br>තාක්ෂණික සීමාවාසික පුහුණු සැලැස්ම (ii, iii) මත පදනම් වූ කුසලතා අවශ්‍ය වන ක්‍රියාකාරකම්වල නිරත වේ.<br>(විශේෂිත නොවන / තාක්ෂණික නොවන ක්ෂේත්‍ර) | සැලකිය යුතු ප්‍රවීණත්වයක් හෝ පළපුරුද්දක් අවශ්‍ය වන රැකියා වල නිරත වේ<br>(විශේෂිත හා තාක්ෂණික ක්ෂේත්‍ර) |
| රැකියා ස්ථාන මාරු කිරීම / වෙනස් කිරීම | මූලික වශයෙන්, නොහැකි ය. කෙසේ වෙතත්, ක්‍රියාත්මක කරන සංවිධානයේ බංකොලොත්භාවය වැනි අවස්ථා සහ (ii) සිට (iii) දක්වා මාරු වන අවස්ථා වල දී සිදු කල හැකි ය. | එකම ව්‍යාපාර අංශයක් තුළ හෝ, විභාග මගින් පොදු නිපුණතා මට්ටම් අවශ්‍ය වන බවට තහවුරු වූ ව්‍යාපාරික ක්ෂේත්‍රවල රැකියා අතර මාරු විය හැකි ය. |

## සත්කාරක සංවිධාන

**1 සත්කාරක සංවිධාන සඳහා විදේශිකයන් පිළිගැනීමේ නිර්ණායක**

(1) විදේශිකයන් සමඟ නිසි රැකියා ගිවිසුමක් තිබිය යුතු ය (උදා: වේතනය ජපන් වැසියන් හා සමානව හෝ ඊට වැඩි)
(2) නිසියාකාර සංවිධානයක් විය යුතු ය (උදා: පසුගිය වසර 5 තුළ ආගමන විගමන හෝ කම්කරු නීති උල්ලංඝනය කර නොමැති වීම)
(3) විදේශිකයන්ට සහාය වීමේ ක්‍රමවේදයක් තිබිය යුතු ය (උදා: විදේශිකයන්ට තේරුම් ගත හැකි භාෂාවකින් සහාය ලබා දිය හැකි වීම)
(4) විදේශිකයන්ට සහාය දැක්වීමේ නිසි සැලසුම් තිබිය යුතු ය (උදා: ජීවන හැඩගැසීම ආදිය)

**2 සත්කාරක සංවිධාන සතු යුතුකම්**

(1) විදේශිකයන් සමඟ ඇති කරගත් රැකියා ගිවිසුම ක්‍රියාත්මක කරන බවට සහතික වීම (උදා: වේතනය නිසි පරිදි ගෙවීම)
(2) විදේශිකයින්ට නිසි සහාය ලබා දීම
→ සහාය ලබා දීම බාහිර ලියාපදිංචි සංවිධානයකට පැවරිය හැකි ය.
සම්පූර්ණයෙන්ම බාහිරින් ලබා ගන්නේ නම්, 1 (3) සම්පූර්ණ වේ.
(3) ආගමන හා විගමන සේවා ඒජන්සියට විවිධ දැනුම්දීම් කිරීම

සටහන: (1) සිට (3) දක්වා නොසලකා හරිනු ලැබුව හොත්, විදේශිකයන් පිළිගැනීමට නොහැකි ය. වීමට අමතරව, ආගමන සේවා ඒජන්සිය මගින් මාර්ගෝපදේශනයක් හෝ වැඩිදියුණු කිරීමේ නියෝගයක් ලැබීමට ද ඉඩ ඇත.

## ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන


**1 ලියාපදිංචිය සඳහා වන නිර්ණායක**

(1) නිසි සංවිධානයක් විය යුතු ය (උදා: පසුගිය වසර 5 තුළ ආගමන විගමන හෝ කම්කරු නීති උල්ලංඝනය කර නොමැති වීම)
(2) විදේශිකයන්ට සහාය වීමේ ක්‍රමවේදයක් තිබිය යුතු ය (උදා: විදේශිකයන්ට තේරුම් ගත හැකි භාෂාවකින් සහාය ලබා දිය හැකි වීම)

**2 ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන සතු යුතුකම්**

(1) විදේශිකයින්ට නිසි සහාය ලබා දීම
(2) ආගමන සේවා ඒජන්සියට විවිධ දැනුම්දීම් කිරීම

සටහන: (1) සහ (2) වගකීම් නොසලකා හරිනු ලැබුව හොත් ලියාපදිංචිය අවලංගු කළ හැකි ය.



# ක්‍රමවේද දළ සටහන (3) රාජකාරි ඇරඹීමට පෙර ප්‍රවාහය



## පිට රටවල සිට ජපානයට පැමිණෙන විදේශිකයින්

තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii)සාර්ථකව අවසන් කර තිබෙන විදේශිකයින්

විභාගවලින් නිදහස් කෙරේ (නිපුණතා/ජපන් භාෂාව)

ජපානයට අලුතෙන් පැමිණෙන විදේශිකයින්

පිටරට වල දී විභාගවලින් සමත් (නිපුණතා/ජපන් භාෂාව)

රැකියා සඳහා ඍජුව අයැදුම් කිරීම හෝ පෞද්ගලික රැකියා ඒජන්සිවලින් රැකියා සෙවීම සඳහා සහාය ලැබීම

<නිපුණතා විභාගය>
· විශේෂිත කාර්මික ක්ෂේත්‍ර පදනම්ව විභාග කිරීම
<ජපන් භාෂා විභාගය>
· මූලික ජපන් භාෂාව සඳහා ජපන් පදනම් පරීක්ෂණය (ජපන් පදනම)
හෝ
· ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (N4 හෝ ඊට වැඩි)
(ජපන් පදනම, ජපන් අධ්‍යාපනික හුවමාරු හා සේවා)
යනාදිය



## ජපානයේ ජීවත් වන විදේශිකයින් (මධ්‍යම සිට දීර්ඝ කාලීන පදිංචිකරුවන්)

තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii) සාර්ථකව අවසන් කර තිබෙන විදේශිකයෝ

විභාගවලින් නිදහස් කෙරේ (නිපුණතා/ජපන් භාෂාව)

විදේශීය ශිෂ්‍ය යනාදීන්

විභාගවලින් සමත් (නිපුණතා/ජපන් භාෂාව)

රැකියා සඳහා ඍජුව අයැදුම් කිරීම හෝ හෙලෝ වර්ක් හෝ පෞද්ගලික රැකියා ඒජන්සිවලින් රැකියා සෙවීම සඳහා සහාය ලැබීම

[සත්කාරක සංවිධානය සමග රැකියා ගිවිසුම තීරණය කිරීම]
සත්කාරක සංවිධානය වෙතින් ප්‍රගමන උපදේශනය ලැබීම හා වෛද්‍ය පරීක්ෂණ ලබා ගැනීම

සුදුසුකම් සහතිකය සඳහා අයැදුම් කිරීම

*සත්කාරක සංවිධානයේ කාර්ය මණ්ඩලය විසින් බලකාර (තමා වෙනුවට) අයැදුම් කිරීම

නේවාසික තත්වය වෙනස් කිරීම පිණිස අයදුම

* සම්මතයක් ලෙස, අයදුම්කරු තමන් විසින්ම අයදුම් කළ යුතු ය.

ප්‍රාදේශීය ආගමන හා විගමන කාර්යාංශය





නිශ්චය කිරීම

සුදුසුකම් සහතිකය නිකුත් කිරීම

සුදුසුකම් සහතිකය සත්කාරක සංවිධානය යැවීම

නිශ්චය කිරීම

නේවාසික තත්වය වෙනස් කිරීමට අනුමැතිය

නේවාසික කාඩ්පත නිකුත් කිරීම

වීසා අයැදුම

*සත්කාරක සංවිධානය විසින් විදේශීය තානාපති කාර්යාලය වෙත සුදුසුකම් සහතිකය යවනු ලැබේ

විදේශීය තානාපති කාර්යාලය

නිශ්චය කිරීම

වීසා බලපත්‍රය නිකුත් කිරීම

ජපානයට ඇතුල් වීම

නේවාසික කාඩ්පත නිකුත් කිරීම
*පසු දිනක නිකුත් කිරීමට ද ඉඩ තිබේ.

[ජපානයට ඇතුල් වීමෙන් පසු (හෝ නේවාසික තත්වය වෙනස් වීමෙන් පසු) ප්‍රමාදයෙන් තොරව ක්‍රියාත්මක කල යුතු දෑ]
O සත්කාරක සංවිධානය විසින් සලසන ජීවිතය පිළිබඳ පූර්ව උපදේශනයට සහභාගී වීම
O පුද්ගලයා ජීවත් වන නාගරික ප්‍රදේශවල නේවාසිකයෙකු වශයෙන් ලියාපදිංචි වීම
O වැටුප් බැංකු ගිණුමක් විවෘත කිරීම
O නිවාස පහසුකම් ලබා ගැනීම
යනාදිය

විදේශිකයින් සඳහා අවශ්‍යතා
O වයස වසර 18 හෝ එයට වැඩි වීම
O නිපුණතා/ජපන් භාෂා විභාගයකින් සමත් වීම.
(තාක්ෂණික සීමාවාසික පුහුණුව (ii) සාර්ථකව අවසන් කර තිබෙන විදේශිකයන් මෙයින් නිදහස් කෙරේ)
O විශේෂිත නිපුණතා ශ්‍රමික (i) වශයෙන් වසර 5 කට වඩා පදිංචිව නොසිටිම
O ආරක්ෂක ඇපයක් ලබාගෙන නොමැති හා දණ්ඩන විස්තර කෙරෙන ගිවිසුමක් අත්සන් කර නොමැති වීම
O ස්වයං අනුග්‍රාහක නම්, සිය වගකීම් ගැන විස්තර මුළුමනින්ම වටහා ගැනීම
යනාදිය

සත්කාරක සංවිධානයේ වැඩ ආරම්භ කිරීම

# අනුග්‍රාහක සැලසුම් දළ සටහන (1)

出入国在留管理庁
ජපාන ආගමන හා විගමන සේවා ඒජන්සිය

## ප්‍රධාන කරුණු

○ සත්කාරක සංවිධාන විසින් විශේෂිත නිපුණතා ශ්‍රමික (i) නියුක්ත විදේශිකයන් සඳහා වෘත්තීය ජීවිතය, දෛනික ජීවිතය සහ සමාජීය ජීවිතය විධිමත්ව හා ස්ථාවර ලෙස පවත්වා ගැනීම සඳහා සැලැස්මක් (විශේෂිත නිපුණතා ශ්‍රමික (i) විදේශිකයින් සඳහා වන අනුග්‍රාහක සැලැස්ම (මෙතැන් සිට "අනුග්‍රාහක සැලැස්ම") ලෙස සඳහන් කෙරේ) නිර්මාණය කළ යුතු ය. "විශේෂිත නිපුණතා ශ්‍රමික (i) හි ක්‍රියාකාරකම් වල දී, මෙම සැලැස්ම මත පදනම්ව අනුග්‍රහය ලබා දිය යුතු ය.

* විශේෂිත නිපුණතා ශ්‍රමික (ii) සඳහා අනුග්‍රහය ලබා දීම අනිවාර්ය නොවේ.

### ■ අනුග්‍රාහක සැලැස්මක් නිර්මාණය කිරීම

- අයදුම් කිරීමේ දී (*) සත්කාරක සංවිධාන මගින් අනුග්‍රාහක සැලැස්මක් නිර්මාණය කළ යුතු අතර, අයදුම් කරන අවස්ථාවේ දී අයදුම්පත සමඟ මෙය ඉදිරිපත් කළ යුතු ය.

* විශේෂිත නිපුණතා ශ්‍රමික (i) සුදුසුකම් සහතිකය සඳහා අයදුම් කිරීම සහ නේවාසික තත්වය යනාදිය වෙනස් කිරීමට අවසර ඉල්ලීම.

### ■ අනුග්‍රාහක සැලසුම් වල ප්‍රධාන අංග

- අමාත්‍යංශ පනත මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි වෘත්තීය ජීවිතය, දෛනික ජීවිතය සහ සමාජීය ජීවිතය සඳහා අවශ්‍ය කරුණු 10 (14 වන පිටුව බලන්න) පිළිබඳ විස්තර සහ ක්‍රම
- අනුග්‍රාහක කළමනාකරු සහ අනුග්‍රාහකගේ නම සහ තනතුර
- අනුග්‍රාහක සැලසුම ක්‍රියාත්මක කිරීමට බාහිර වෙනත් පාර්ශවයකට ගිවිසුම්ගතව ලබා දෙන විට, එම පාර්ශවයේ නම සහ ලිපිනය
- ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානය (බාහිර ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානයකට ලබා දුන් විට පමණි)


### ■ අනුග්‍රාහක සැලැස්ම ක්‍රියාත්මක කිරීම බාහිර ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානයකට පැවරීම

- සත්කාරක සංවිධාන මගින් අනුග්‍රාහක සැලැස්ම සම්පූර්ණයෙන් හෝ කොටසක් බාහිර වෙනත් පාර්ශවයකට පැවරිය හැකි ය (අනුග්‍රහය බාහිරට පැවරීමේ ගිවිසුමක් සම්පූර්ණ කරමින්).
- සත්කාරක සංවිධානය විසින් අනුග්‍රාහක සැලැස්ම ක්‍රියාත්මක කිරීම ලියාපදිංචි බාහිර අනුග්‍රාහක සංවිධානයකට (15 වන පිටුව බලන්න) පවරා දෙන විට, විදේශිකයන්ට අනුග්‍රහය සැපයීම සඳහා ක්‍රමවේදයක් ඔවුන් සතුව ඇතැයි සැලකේ.
- බාහිර ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන විසින්, සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා, නැවතත් වෙනත් බාහිර සංවිධානයකට පැවරිය නොහැක (අනුග්‍රාහක ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා පරිවර්තකයන් යනාදියගේ සහාය ලබාගත හැකි ය).

# අනුග්‍රාහක සැලසුම් දළ සටහන (2)



### (1) **ප්‍රගමන උපදේශනය සැලසීම**
·රැකියා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව, එහෙත්, සුදුසුකම් සහතිකයක් සඳහා අයැදුම් කිරීමට හෝ නේවාසික තත්වය වෙනස් කිරීමට අවසර ඉල්ලීමට පෙර, පෞද්ගලිකව හෝ වීඩියෝ ඇමතුමක් මගින් සේවා කොන්දේසි, ආගමන පිළිවෙත හා ආරක්ෂක ඇපයක් ලබාගැනීමක් තිබෙන බව යනාදිය වටහා දීම




### (2) **ජපානයට ඇතුල්වීමේ දී හා පිටවීමේ දී කැඳවා ගෙන ඒම හා ඇරල වීම**
· ජපානයට ඇතුල් වීමේ දී ගුවන් තොටුපලේ සිට කාර්යාලය හෝ නිවෙස වෙත කැඳවා ගෙන ඒම
·ආපසු යෑමේ දී ගුවන් තොටුපලේ ආරක්ෂක මුරපොල දක්වා ඇරල වීම



### (3) **නිවාස /ජීවත් වීමේ පහසුකම් ලබාගැනීමට අවශ්‍ය ගිවිසුම් මගින් ආධාර කිරීම**
·සම ඇපකරු වශයෙන් පෙනී සිටීම, සමාගමට අයත් නිවාස සැපයීම යනාදිය
·බැංකු ගිණුමක් විවෘත කිරීම හා උපයෝගීතා හා ජංගම දුරකථන ගිවිසුම් යනාදිය ස්ථාපිත කර ගැනීම සඳහා උපදේශනය




### (4) **ජීවිතය පිළිබඳ පූර්ව උපදේශනය සැලසීම**
·සුමට සමාජ දිවියක් සඳහා ජපන් රීති හා සිරිත් විරිත්, රාජ්‍ය ආයතන භාවිතා කරන ආකාරය, සබඳතා තොරතුරු හා ආපදා ප්‍රතිචාර ගැන වටහා දීම



### (5) **නිල පිළිවෙත් සඳහා කැටුව යාම**
·අවශ්‍ය පරිදි, නේවාසික ලියාපදිංචිය, සමාජ ආරක්ෂණය හා බදු පිළිවෙත යනාදිය සඳහා කැටුව යාම හා ලේඛන සකස් කිරීමේ ලා ආධාර වීම




### (6) **ජපන් ඉගෙනීමට අවස්ථා සැලසීම**
·ජපන් භාෂා පංතිවලට බැඳීම සඳහා තොරතුරු හා ජපන් ඉගෙන ගැනීමට අවශ්‍ය මෙවලම් යනාදිය ගැන තොරතුරු සැපයීම




### (7) **ප්‍රශ්නවලට හා පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම**
·රාජකාරි හා ජීවත් වීම ගැන උපදේශන හා පැමිණිලි සම්බන්ධයෙන්, විදේශිකයාට සම්පූර්ණයෙන්ම තේරුම් ගැනීමට හැකි වන භාෂාවකින් අවශ්‍ය උපදේශන හා ඔවදන් ලබා දීම



### (8) **ජපන් ජාතිකයින් සමග සහජීවනය ප්‍රවර්ධනය කිරීම**
·අසල්වැසි සංවිධාන, ප්‍රාදේශීය උත්සව යනාදීන් වලට සහජීවනයෙන් සහභාගී වීම පිණිස උපදේශන හා සහාය ලබා දීම




### (9) **රැකියාවේ වෙනස් වීම් වල දී ආධාර කිරීම (කාර්ය මණ්ඩලය අඩු කිරීම් යනාදී අවස්ථාවල)**
·සත්කාරක පාර්ශ්වයේ අවශ්‍යතාව මත රැකියා ගිවිසුම අවලංගු කරනුයේ නම්, ඔවුනට නව රැකියා සොයා දීම, නිර්දේශ ලිපි සකස් කර දීම, හා අවශ්‍ය පරිපාලනමය පිළිවෙත් වල තොරතුරු සැපයීම මෙන්ම නව රැකියාවක් සෙවීම සඳහා වැටුප් සහිත නිවාඩු ලබා දීම



### (10) **ක්‍රමවත් සම්මුඛ සාකච්ඡා සහ පරිපාලනමය ඒජන්සි වෙත වාර්තා කිරීම**
·වගකිවයුතු පුද්ගලයා විසින් විදේශිකයා හෝ ඔහුගේ සේවායෝජකයාව (අවම වශයෙන් තුන් මසකට වරක්) ක්‍රමවත් ලෙස හමු වී, කම්කරු ප්‍රමිති පනත උල්ලංඝණය වී ඇත්නම්, ඒවා වාර්තා කිරීම



# ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන මොනවා ද?




## ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන යනු මොනවා ද?

- ○ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන විසින්, සත්කාරක සංවිධාන සමග අනුග්‍රාහයන් බාහිරව ලබාගැනීමේ ගිවිසුම්වල නියැලී සිටීම මගින්, අනුග්‍රාහක සැලසුම් මත පදනම්ව සියලුම ආධාර සැපයීම සිදු කර යි.
- ○ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානයක් වීම පිණිස ආගමන සේවා ඒජන්සියේ අධ්‍යක්ෂක මගින් ලියාපදිංචි වීම අවශ්‍ය වේ.
- ○ ලියාපදිංචි සංවිධාන, ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන ලෙස ලියාපදිංචි ලේඛනයට ඇතුළත් කරන අතර, ඒවා ආගමන සේවා ඒජන්සියේ වෙබ් අඩවියට යවනු ලැබේ.
- ○ ලියාපදිංචිය වසර 5 ක් සඳහා වන අතර, දීර්ඝ කර ගත හැක.
- ○ ලියාපදිංචිය සඳහා අයැදුම් ගාස්තුවක් ගෙවිය යුතු ය. (නව ලියාපදිංචි - යෙන් 28,400; දීර්ඝ කිරීම් - යෙන් 11,100
- ○ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන විසින්, ක්‍රමානුකූල හා අදාළ පරිදි විවිධ නිවේදන ආගමන සේවා ඒජන්සියේ අධ්‍යක්ෂක වෙත යැවිය යුතුයි.

## ප්‍රධාන කරුණු

○ සත්කාරක සංවිධාන සහ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන විසින් ආගමන සේවා ඒජන්සියේ අධ්‍යක්ෂක වෙත නිරන්තරයෙන් විවිධ දැනුම්දීම් කළ යුතු ය.

○ සත්කාරක සංවිධානය විසින් දැනුම් දීමට අපොහොසත් වීම හෝ අසත්‍ය වාර්තා ඉදිරිපත් කිරීම දඬුවම් ලැබීමට හේතු වේ.

## ■ සත්කාරක සංවිධානයේ දැනුම්දීම් *උල්ලංඝනය කළ හොත් දැනුවත් කිරීම් සහ දඬුවම් වලට යටත් වේ

[අවශ්‍යතාව අනුව දැනුම්දීම්]

- විශේෂිත නිපුණතා ශ්‍රමිකයාගේ රැකියා ගිවිසුම්වල වෙනස්කම්, ගිවිසුම අවසන් කිරීම් සහ නව ගිවිසුම් ඇරඹීම ආදී දැනුම්දීම්
- අනුග්‍රාහක සැලැස්මේ වෙනස්කම් දැනුම්දීම
- බාහිර ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානයකට අනුග්‍රහය පවරා දීමේ ගිවිසුම්, ගිවිසුම් වෙනස් කිරීම් හෝ ගිවිසුම් අවසන් කිරීම් පිළිබඳ දැනුම්දීම්
- විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයෙකු පිළිගැනීමට අපහසු බව දැනුම් දීම
- ආගමන විගමන හෝ කම්කරු නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් සිදු කල වැරදි පිළිබඳ දැනුම්දීම.

[ක්‍රමානුකූල දැනුම්දීම]

- විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයින්ගේ පිළිගැනීමේ තත්ත්වය පිළිබඳ දැනුම්දීම් (උදා: පිළි ගත් විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ තොරතුරු උදා: නම, රැකියාවේ නියුතු දින ගණන, ස්ථානය, ව්‍යාපාරයේ තොරතුරු ආදිය)
- අනුග්‍රාහක සැලසුම් ක්‍රියාත්මක වීමේ තත්ත්වය පිළිබඳ දැනුම්දීම (උදා: උපදේශනවල අන්තර්ගතය සහ ප්‍රතිචාර ප්‍රතිඵල) * සියලු අනුග්‍රාහක සැලැස්ම ක්‍රියාත්මක කිරීමට බාහිර ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානයකට පවරා ඇති ස්ථාන හැර.
- විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයන්ගේ ක්‍රියාකාරකම් තත්ත්වය පිළිබඳ දැනුම්දීම් (උදා: වේතන ගෙවීම් පිළිබඳ, සේවයෙන් ඉවත් වන ශ්‍රමිකයන් සංඛ්‍යාව, අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාව, පිළිගැනීමේ පිරිවැය යනාදිය.)

## ■ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානයේ දැනුම්දීම්

*උල්ලංඝනය කිරීමෙන්, දැනුවත් කිරීම් සහ ලියාපදිංචි අවලංගු කිරීමකට යටත් වේ.

[අවශ්‍යතාව අනුව දැනුම්දීම්]

- ලියාපදිංචි කිරීමේ අයදුම්පත් වල වෙනස්කම් දැනුම් දීම
- අනුග්‍රාහක සේවා අත්හිටු වීම පිළිබඳ දැනුම්දීම

[ක්‍රමානුකූල දැනුම්දීම]

- අනුග්‍රහය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ දැනුම්දීම

(උදා. විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයාගේ නම, සත්කාරක සංවිධානයේ නම, විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයාගේ උපදේශන තොරතුරු සහ ප්‍රතිචාර තත්ත්වය යනාදිය.)

(ක්‍රමානුකූල නිවේදන) *සත්කාරක සංවිධාන සහ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධාන දෙකම
○ ඊළඟ කාර්තුව ආරම්භ වී දින 14 ක් ඇතුළත කාර්තුමය දැනුම්දීම
(1) 1Q: ජනවාරි 1 සිට මාර්තු 31 දක්වා
(2) 2Q: අප්‍රේල් 1 සිට ජුනි 30 දක්වා
(3) 3Q: ජූලි 1 සිට සැප්තැම්බර් 30 දක්වා
(4) 4Q: ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 31 දක්වා


# ක්ෂේත්‍ර අනුව විශේෂිත නිපුණතා ශ්‍රමික මණ්ඩල

## ප්‍රධාන කරුණු

○ පද්ධතියේ නිසි මෙහෙයුම සඳහා ඒ ඒ ක්ෂේත්‍රවල නිසි අමාත්‍යාංශය විසින් එක් එක් විශේෂිත කාර්මික ක්ෂේත්‍ර සඳහා මණ්ඩලයක් පිහිටුව යි.

○ සිය අවශ්‍යතා සඳහා විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයින් පිළිගැනීමේ දී හා නීතියට අනුකූල වීමේ දී ඇති වන ගැටළු ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය මෙහෙයුම්කරුවන්ට හැකි වන අයුරින් මෙම මණ්ඩල විසින් සාමාජිකයින් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කර, ක්‍රමවේද හා තොරතුරු බෙදා හදා ගනියි.

## රූප සටහන




## ක්‍රියාකාරකම් විස්තර

○ විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයින් භාර ගැනීමේ අරමුණු හා ක්‍රියාවලියේ හොඳ උදාහරණ (බෙස්ට් ප්‍රැක්ටිස්) බෙදා හදා ගැනීම
○ යම් විශේෂිත නිපුණතා ශ්‍රමිකයින්ට සම්බන්ධ සංවිධාන සඳහා නීතිමය අනුකූලත්වය ගැන දැනුවත් කිරීම
○ රැකියා ව්‍යුහයන් හා ආර්ථික තත්වයන්හි වෙනස් වීම් ගැන තොරතුරු වටහා ගෙන විශ්ලේෂණය කිරීම
○ ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රමික හිඟයන් වටහා ගෙන විශ්ලේෂණය කිරීම
○ ශ්‍රමික හිඟයන් හා සත්කාරක තත්ව යනාදිය පදනම්ව, (ශ්‍රමිකයන් වැඩිපුර සිටින ප්‍රදේශ හඳුනා ගෙන සාමාජිකයන් වෙත අවශ්‍ය ඉල්ලීම් කිරීම ඇතුළුව) නාගරික පෙදෙස්වල ශ්‍රමික සංකේන්ද්‍රණය අඩු කිරීමේ පියවර පරීක්ෂා කිරීම හා ඒවායේ ගැළපීම
○ සත්කාරක ක්‍රියාකාරකම් සුමට හා නිසි අයුරින් ක්‍රියාත්මක කිරීම උදෙසා වෙනත් තොරතුරු, ගැටළු හා උපදේශන යනාදිය බෙදා හදා ගැනීම

සටහන: ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සත්කාරක සංවිධාන විසින්, කර්මාන්ත සංවිධානය සමග ඒකාබද්ධව පිහිටුවා ඇති සංස්ථාවට ඇතුලත් වීම අවශ්‍යතාවක් වන අතර, මෙම සංස්ථාව මණ්ඩලයේ සාමාජිකයෙකි.

# "විශේෂිත නිපුණතා ශ්‍රමිකයන්" සඳහා වන සහයෝගිතා ගිවිසුමේ (MOC) දළ සටහන



## රජයේ මූලික ප්‍රතිපත්ති (කැබිනට් තීරණය, 2018 දෙසැම්බර් 25)

මුදල් ලබාගන්නා වැනි අනිෂ්ට තැරැව්කරුවන්ගේ මැදිහත් වීම වැළැක්වීම සඳහා අන්තර් රාජ්‍ය ද්විපාර්ශ්වික විධිවිධාන සකස් කිරීම වැනි අවශ්‍ය පියවර ගැනීම

## පුළුල් මූල පිරීම් (අමාත්‍ය තීරණය, 2018 දෙසැම්බර් 25)

○ විදේශීය ශ්‍රමිකයින් ක්‍රමවත්ව හා නිසි ලෙස පිළිගැනීම ප්‍රවර්ධනය කිරීමේ මූල පිරීම්: ව්‍යාජ තැරැව්කරුවන් ඉවත් කිරීම

අන්තර් රාජ්‍ය ද්විපාර්ශ්වික විධිවිධාන සකස් කිරීම, තොරතුරු හුවමාරු කර ගැනීම ආදී ක්‍රමවේදයක් ගොඩනැගීම මගින්, ජපන් භාෂා විභාග පවත්වනු ලබන සහ විදේශීය ශ්‍රමිකයන් පිටත් කරවීමට අපේක්ෂා කරන රටවල් 9 (මෙතැන් සිට "ප්‍රමුඛතා රටවල් නවය") තුළින් ව්‍යාජ තැරැව්කරුවන් තුරන් කිරීම ඉලක්ක කෙරේ. අවශ්‍ය වෙතොත්, ඉහත රටවල් හැර ශ්‍රමිකයන් පිටත් කර යැවීමට අපේක්ෂා කරන වෙනත් රටවල් සමඟ ද, ඒ හා සමාන අන්තර් රාජ්‍ය ලියකියවිලි සෑදීම සඳහා සාකච්ඡා කෙරේ.

## MOC ප්‍රධාන කරුණු

○ තොරතුරු බෙදා ගැනීම


විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයන් ක්‍රමවත්ව හා නිසි ලෙස පිටත් කර යැවීමටත් පිළිගැනීමටත් ප්‍රයෝජනවත් තොරතුරු ඉක්මනින් බෙදාහැරීම. විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයන් පිටත් කර යැවීමටත් පිළිගැනීමටත් සම්බන්ධ දෙරටේම සංවිධාන විසින් සිදු කරන පහත සඳහන් ක්‍රියා මෙම තොරතුරු වලට ඇතුළත් වේ.

- ආරක්ෂක තැන්පතු එකතු කිරීම, දඩුවම් නියම කිරීම, මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, ව්‍යාජ ලේඛන, වියදම් සඳහා අසාධාරණ ලෙස මුදල් එකතු කිරීම යනාදිය.

○ ගැටළු පිළිබඳ උපදේශන

පද්ධතියේ නිසි ක්‍රියාකාරීත්වයට සහ වැඩිදියුණු කිරීමට අවශ්‍ය වන ගැටළු නිරාකරණය කිරීම සඳහා නිතිපතා හා අවශ්‍ය පරිදි සාකච්ඡා කිරීම.

## MOC රූප සටහන




## අත්සන් කරන්නන් (රටවල් 11)

<u>(2019 **දෙසැම්බර් මස අවසානය වන විට; තද කළු අකුරින් දැක්වෙන්නේ විස්තරාත්මක** MOC **අවසන් කර ඇති රටවල්**)</u>


**පිලිපීනය** (මාර්තු 19), **කාම්බෝජය** (මාර්තු 25), **නේපාලය** (මාර්තු 25), **මියන්මාරය** (මාර්තු 28), **මොන්ගෝලියාව** (අප්‍රේල් 17), ශ්‍රී ලංකාව (ජූනි 19), **ඉන්දුනීසියාව** (ජූනි 25), **වියට්නාමය** ( ලිපි ලේඛන හුවමාරුව ජූලි 1) , බංග්ලාදේශය (අගෝස්තු 27), උස්බෙකිස්ථානය (දෙසැම්බර් 17) , පකිස්තානය (දෙසැම්බර් 23)

# විශේෂිත නිපුණතා ශ්‍රමික ක්‍රමයේ මෙහෙයුම් තත්ත්වය (1)


## විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමික බලපත්‍රවල තත්වය (2019 දෙසැම්බර් මස අවසානය වන විට; මූලික)

① සුදුසුකම් සහතිකය නිකුත් කිරීම 1,139 ක්
② නේවාසික තත්වය වෙනස් කිරීමට අවසර දීම 1,062 ක්
③ ලියාපදිංචි අනුග්‍රාහක සංවිධානයක් ලෙස ලියාපදිංචි වීම 3,451 ක්
④ අවසර ලත් විශේෂ අවස්ථා ලෙස "නම් කරන ලද ක්‍රියාකාරකම්" 857 ක්


(නිකුත් නොකල ඒවා ද ඇතුලත්ව)




### අවසර ලත් අවස්ථාවන්ගේ අනුබණ්ඩනය




## විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයින් සංඛ්‍යාව (2019 නොවැම්බර් මස අවසානය වන විට; මූලික)




පුද්ගලයන් 1,019

| ක්ෂේත්‍රය | පුද්ගලයන් |
|---|---|
| හෙද සත්කාර | 19 |
| ගොඩනැගිලි පිරිසිදු කිරීම | 12 |
| යන්ත්‍ර කොටස් සහ මෙවලම් කර්මාන්ත | 143 |
| කාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්තය | 151 |
| විදුලි, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු කර්මාන්ත | 31 |
| ඉදිකිරීම් කර්මාන්තය | 59 |
| නැව් තැනීම සහ නැව් යන්ත්‍රෝපකරණ කර්මාන්තය | 32 |
| මෝටර් රථ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | 8 |
| ගුවන් සේවා කර්මාන්තය | 0 |
| හෝටල් කර්මාන්තය | 13 |
| කෘෂිකර්මාන්තය | 169 |
| ධීවර හා ජලජීවී වගාව | 8 |
| ආහාර සහ බීම නිෂ්පාදනය | 303 |
| ආහාර සේවා කර්මාන්තය | 71 |

# විශේෂිත නිපුණතා ශ්‍රමික ක්‍රමයේ මෙහෙයුම් තත්ත්වය (2)



**විශේෂිත නිපුණතා ශ්‍රමික පරීක්ෂණ ආදිය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය.** (2019 **දෙසැම්බර් මස අවසානය වන විට, එක් එක් පරීක්ෂණ සංවිධානයේ වෙබ් අඩවියේ තොරතුරු අනුසාරයෙන් නිර්මාණය කරන ලදී)**

| | ස්ථානය (මාසය) | විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | සමත් වූ සංඛ්‍යාව | අනාගත කාලසටහන (සටහන 1) |
|---|---|---|---|---|
| හෙද සත්කාර | (පිලිපීනය) 2019 අප්‍රේල්-දෙසැම්බර්<br>(කාම්බෝජය) 2019 සැප්තැම්බර්-දෙසැම්බර්<br>(ඉන්දුනීසියාව) 2019 ඔක්තෝබර්-දෙසැම්බර්<br>(නේපාලය) 2019 ඔක්තෝබර්-දෙසැම්බර්<br>(මොන්ගෝලියාව) 2019 නොවැම්බර්, දෙසැම්බර්<br>(ජපාන දේශීය) 2019 ඔක්තෝබර්-දෙසැම්බර් | (නිපුණතා විභාගය)<br>පුද්ගලයන් 2,634 (සටහන 2)<br>(ජපන් භාෂා විභාගය)<br>පුද්ගලයන් 2,612 (සටහන 2) | (නිපුණතා විභාගය)<br>පුද්ගලයන් 1,254 (සටහන 2)<br>(ජපන් භාෂා විභාගය)<br>පුද්ගලයන් 1,285 (සටහන 2) | (පිලිපීනය) 2020 ජනවාරි<br>(කාම්බෝජය) 2020 ජනවාරි<br>(ඉන්දුනීසියාව) 2020 ජනවාරි<br>(නේපාලය) 2020 ජනවාරි |
| ගොඩනැගිලි පිරිසිදු කිරීම | (මියන්මාරය) 2019 දෙසැම්බර්<br>(ජපාන දේශීය) 2019 නොවැම්බර්, දෙසැම්බර් | පුද්ගලයන් 472 | පුද්ගලයන් 317 | — |
| යන්ත්‍ර කොටස් සහ මෙවලම් කර්මාන්ත (සටහන 3)<br>කාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්තය (සටහන 3)<br>විදුලි, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු කර්මාන්ත (සටහන 3) | — | — | — | (ඉන්දුනීසියාව) 2020 ජනවාරි |
| නැව් තැනීම සහ නැව් යන්ත්‍රෝපකරණ කර්මාන්තය (සටහන 3) | (පිලිපීනය) 2019 නොවැම්බර් | (සටහන 2) | (සටහන 2) | — |
| මෝටර් රථ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | (පිලිපීනය) 2019 දෙසැම්බර් | පුද්ගලයන් 12 | පුද්ගලයන් 12 | (පිලිපීනය) 2020 ජනවාරි-මාර්තු |
| ගුවන් සේවා කර්මාන්තය (සටහන 3) | (පිලිපීනය) 2019 නොවැම්බර්<br>(මොන්ගෝලියාව) 2019 ඔක්තෝබර්<br>(ජපාන දේශීය) 2019 නොවැම්බර් | පුද්ගලයන් 227 | පුද්ගලයන් 128 | (ජපාන දේශීය) 2019 පෙබරවාරි |
| හෝටල් කර්මාන්තය | (මියන්මාරය) 2019 ඔක්තෝබර්<br>(ජපාන දේශීය) 2019 අප්‍රේල්, ඔක්තෝබර් | පුද්ගලයන් 1,280 | පුද්ගලයන් 728 | (ජපාන දේශීය) 2020 ජනවාරි |
| කෘෂිකර්මාන්තය (සටහන 3) | (පිලිපීනය) 2019 ඔක්තෝබර්-දෙසැම්බර් | පුද්ගලයන් 9 (සටහන 2) | පුද්ගලයන් 9 (සටහන 2) | (පිලිපීනය) 2020 ජනවාරි-මාර්තු<br>(කාම්බෝජය) 2020 ජනවාරි-මාර්තු<br>(ඉන්දුනීසියාව) 2020 ජනවාරි-මාර්තු |
| ධීවර හා ජලජීවී වගාව (සටහන 3) | — | — | — | (ඉන්දුනීසියාව) 2020 ජනවාරි |
| ආහාර සහ බීම නිෂ්පාදනය | (පිලිපීනය) 2019 නොවැම්බර්, දෙසැම්බර්<br>(ජපාන දේශීය) 2019 ඔක්තෝබර් | පුද්ගලයන් 626 (සටහන 2) | පුද්ගලයන් 433 (සටහන 2) | (පිලිපීනය) 2020 ජනවාරි-මාර්තු<br>(ඉන්දුනීසියාව) 2020 ජනවාරි-මාර්තු<br>(ජපාන දේශීය) 2020 පෙබරවාරි |
| ආහාර සේවා කර්මාන්තය | (පිලිපීනය) 2019 නොවැම්බර්, දෙසැම්බර්<br>(ජපාන දේශීය) 2019 අප්‍රේල්, ජූනි, සැප්තැම්බර්, නොවැම්බර් | පුද්ගලයන් 4,717 (සටහන 2) | පුද්ගලයන් 2,966 (සටහන 2) | (පිලිපීනය) 2020 ජනවාරි-මාර්තු<br>(කාම්බෝජය) 2020 ජනවාරි-මාර්තු<br>(ජපාන දේශීය) 2020 පෙබරවාරි |
| මූලික ජපන් සඳහා ජපන් පදනම් පරීක්ෂණය | (පිලිපීනය) 2019 අප්‍රේල්-ජූනි, අගෝස්තු- නොවැම්බර්<br>(කාම්බෝජය) 2019 ඔක්තෝබර්<br>(ඉන්දුනීසියාව) 2019 ඔක්තෝබර්, නොවැම්බර්<br>(නේපාලය) 2019 ඔක්තෝබර්, නොවැම්බර්<br>(මොන්ගෝලියාව) 2019 නොවැම්බර් | පුද්ගලයන් 2,279 | පුද්ගලයන් 779 | (පිලිපීනය) 2020 ජනවාරි<br>(කාම්බෝජය) 2020 ජනවාරි<br>(ඉන්දුනීසියාව) 2020 ජනවාරි<br>(නේපාලය) 2020 ජනවාරි |

සටහන 1: 2020 ජනවාරි මාසයෙන් පසු ක්‍රියාත්මක කිරීමේ කාලසටහන් වෙනස් වේ.
සටහන 2: නොවැම්බර් මාසයෙන් පසු පැවැත් වූ හෙද සත්කාර (නිපුණතා විභාගය සහ ජපන් භාෂා විභාගය), නැව් තැනීම සහ නැව් යන්ත්‍රෝපකරණ කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ආහාර සහ බීම නිෂ්පාදනය සහ ආහාර සේවා කර්මාන්තය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් සහ සමත් වූ සංඛ්‍යා තවම සම්පූර්ණ ලෙස වාර්තා වී නොමැත. එබැවින් වාර්තා නොවූ කොටස මෙහි දී එකතුවට ඇතුළත් කර නොමැත.
සටහන 3: ව්‍යාපාරික අංශ අනුව විභාග ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය වෙනස් වේ.

# මූලික ප්‍රතිපත්ති සහ නිසි අමාත්‍යාංශ ආඥා පනත ආදිය.

# විශේෂිත නිපුණතා ශ්‍රමික නේවාසික තත්වය මෙහෙයවීමේ මූලික ප්‍රතිපත්ති දළ සටහන

**විශේෂිත නිපුණතා ශ්‍රමික නේවාසික තත්වය උදෙසා නිසි ක්‍රමයක් පිහිටුවීම පිණිස, විශේෂිත නිපුණතා ශ්‍රමික නේවාසික තත්වය ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික ප්‍රතිපත්ති (ආගමන පාලන හා සරණාගතයන් පිළිගැනීමේ පනතේ 2-3 වගන්තීන් ප්‍රතිශෝධනය කිරීම)**

## 1 පද්ධතිවල වැදගත්කමට අදාළ කරුණු

ඵලදායිතාව වැඩිදියුණු කිරීමට හා දේශීය මානව සම්පත් ලබාගැනීමට දැරූ ජාතික ප්‍රයත්නවලින් අනතුරුව ද, මානව සම්පත් ලබාගැනීමට දුෂ්කරවූ තත්වයන් යටතේ මධ්‍ය හා කුඩා ව්‍යාපාරවල ද ඇතුළුව වැඩි වෙමින් පවතින ශ්‍රමික හිඟයට ප්‍රතිචාර දැක්වීම උදෙසා ද, කාර්මික ක්ෂේත්‍රයේ යම් විශේෂඥ දැනුමක් හා නිපුණතාව යම් මට්ටමකට තිබෙන හා වහාම රැකියාවල යෙදීමට සූදානම් විදේශිකයින් භාර ගැනීම පිණිස මෙම ක්‍රමය විකාශය කර තිබේ.

## 2 කාර්මික ක්ෂේත්‍රවල තිබෙන හිඟය නිසා විදේශිකයන් අතරින් මානව සම්පත් ලබාගැනීමට අදාලවූ කරුණු

➢ විදේශීය විශේෂිත නිපුණතා ශ්‍රමිකයින් භාරගන්නා ක්ෂේත්‍ර

ඵලදායිතාව වැඩිදියුණු කිරීමට හා දේශීය මානව සම්පත් ලබාගැනීමට දැරූ ජාතික ප්‍රයත්නවලින් අනතුරුවද, මානව සම්පත් ලබාගැනීමේ දුෂ්කරතාවයන් සැලකිල්ලට ගත් විට, හිඟව තිබෙන මෙම මානව සම්පත් විදේශිකයන් අතරින් ලබාගැනීමට කාර්මික ක්ෂේත්‍රවලට (විශේෂිත කාර්මික ක්ෂේත්‍ර) පුළුවනි.

➢ මානව සම්පත් හිඟය සම්බන්ධයෙන් ප්‍රදේශ පසුබිම් සලකා බැලීම

සේවා නියුක්තිය නාගරික පෙදෙස් හා වෙනත් විශේෂිත පෙදෙස් තුල අධික ලෙස කේන්ද්‍ර ගත නොවන පරිදි අවශ්‍ය පියවර ගැනීමට වෙහෙසීම.

➢ ඇස්තමේන්තු කල භාරගන්නා සංඛ්‍යාව  ක්ෂේත්‍ර-විශේෂී කළමනාකරණ ප්‍රතිපත්ති පදනම්ව වසර 5 ක් මුළුල්ලේ භාර ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව විස්තර කරයි.

## 3 අවශ්‍ය මානව සම්පත් වලට සම්බන්ධ කරුණු

